**වගුව 4.2 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී සහ බලපත් ලබාගෙන ඇති සංචාරක සේවාවන්**

| කාණ්ඩය | 2018 ජන. 01 සිට දෙසැ. 31 දක්වා | 2018 අවසානය දක්වා |
|---|---|---|
| ආපනශාලා | 26 | 439 |
| සංචාරක නියෝජිත ආයතන | 69 | 901 |
| ස්පා සහ සුවතා මධ්‍යස්ථාන | 22 | 80 |
| සංචාරක සාප්පු | 5 | 78 |
| ජල ක්‍රීඩා මධ්‍යස්ථාන | 2 | 27 |
| කුළුබඩු උයන් | 3 | 37 |
| එකතුව | 127 | 1,562 |

## 4.3 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී සහ බලපත් ලබාගෙන ඇති සංචාරක මඟපෙන්වන්නන්

**වගුව 4.3 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී සහ බලපත් ලබාගෙන ඇති සංචාරක මඟපෙන්වන්නන්**

| කාණ්ඩය | 2018 ජන. 01 සිට දෙසැ. 31 දක්වා | 2018 අවසානය දක්වා |
|---|---|---|
| ජාතික සංචාරක මාර්ගෝපදේශන | 24 | 1425 |
| රථාචාර්ය සංචාරක මාර්ගෝපදේශන | 41 | 1185 |
| ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශන | 01 | 537 |
| පරිශ්‍ර සංචාරක මාර්ගෝපදේශන | - | 92 |
| එකතුව | 66 | 3239 |

සටහන් - මගපෙන්වන්නන්ගේ සේවා ගුණාත්මකභාවය පිළිබඳ සොයාබැලීම සහ බලපත්‍රවල වලංගුභාවය පරීක්ෂාකිරීම සඳහා පොළොන්නරුවේදී පරිශ්‍ර පරීක්ෂාවක් සිදුකරන ලදී.

## 4.4 මත්පැන් සඳහා වන බලපත්‍ර සහ නේවාසික වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ - 2018

### 4.4.1 මත්පැන් සඳහා වන බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ - 2018

සංචාරක සේවා සපයන්නන්ගේ ඉල්ලීම මත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මත්පැන් බලපත්‍ර සඳහා

සුරාබදු දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබාදෙයි. එම නිර්දේශ ඇගයීමෙන් පසු අදාළ ආයතන සුරාබදු දෙපාර්තමේන්තුවේ රෙගුලාසි අනුගමනය කරන ආයතන සඳහා බලපත්‍ර ලබාදීම කෙරේ. ආකාර කිහිපයකට අයත් සුරාබදු බලපත්‍ර තිබේ.

**වගුව 4.4.1 සංචාරක ආයතන කාණ්ඩය අනුව 2018 වර්ෂයේදී මත්පැන් බලපත්‍ර ලබාගැනීම සඳහා කරන ලද නිර්දේශ.**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| වර්ගීකරණය කරන ලද හෝටල් | 101 |
| වර්ගීකරණය නොකරන ලද හෝටල් | 132 |
| බුටික් හෝටල් | 17 |
| බුටික් විලා | 21 |
| අමුත්තන්ගේ නිවාස | 461 |
| අවන්හල් | 285 |
| එකතුව | 1017 |

### 4.4.2 නේවාසික වීසා සඳහා වන බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ - 2018

සංචාරක ආයතනවල රැකියා සඳහා විදේශිකයින් ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර ඇගයීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ක්‍රමවේදයක් අනුගමනය කරයි. විශේෂ අවස්ථාවලදී පමණක් ඒ සඳහා සුදුසුකම් සහ තාක්ෂණික දැනුම සහිත පුද්ගලයන් රට තුළ නොමැතිවිට විශේෂිත කාල පරිච්ඡේදයක් සඳහා විදේශිකයන් බඳවා ගැනීමට නිර්දේශ ලබාදේ.

**වගුව 4.4.2 සංචාරක මධ්‍යස්ථානවලට 2018 වර්ෂයේදී සංචාරක වීසා ලබාගැනීම සඳහා ලබාදෙන ලද නිර්දේශය**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| බුටික් හෝටල් | 06 |
| අමුත්තන්ගේ නිවාස | 14 |
| හෝටල් | 70 |
| ආයෝජකයින් | 03 |
| භෝජනාගාර | 31 |
| ස්පා | 151 |
| සංචාරක නියෝජිතායතන | 129 |
| ජල ක්‍රීඩා | 7 |
| එකතුව | 411 |

## 4.5 දැනුම්වත් කිරීම හා පුහුණු වැඩසටහන් සහ ජංගම සේවා

තෝරාගත් සංචාරක කලාපවල කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ පාර්ශවකරුවන් විශේෂයෙන්ම නිවෙස්වල ලැගුම් ගැනීම් අමුත්තන්ගේ නිවාස, බංගලා භෝජනාගාර සහ සංචාරකයන්ට ප්‍රියජනක ආහාර ගැනීමේ ස්ථාන වල තත්ත්වය සහ සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සංචාරක ක්‍රමෝපාය සැලැස්මට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් දැනුම්වත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් කිහිපයක්ම පවත්වන ලදි.

**වගුව 4.5 පවත්වන ලද සංචාරක පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර**

| ප්‍රතිලාභීන් | ස්ථානය | දිනය |
|---|---|---|
| සංචාරක ආකර්ෂණීය ආහාර ගැනීමේ ස්ථාන | ගාල්ල | අප්‍රේල් |
| සංචාරක කර්මාන්තයේ සංචාරකයින් මෙහෙයවීම, සෞඛ්‍යමත් ආහාර, ආහාර සහ පාන සපයන කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ පාර්ශවකරුවන් සහ සංචාරක පොලීසියේ කාර්යභාරය පිළිබඳ දැනුම්වත්කිරීම | ඇල්ල | මැයි |
| සංචාරකයන්ට නැවතීමේ පහසුකම් සලසන නිවෙස් හිමියන් | දෙනියාය | ජුනි 28 |
| සංචාරක සේවා සපයන්නන් | සීගිරිය සහ දඹුල්ල | ජුලි 05 |
| සංචාරක සේවා සපයන්නන් | කිතුල්ගල | අගෝස්තු 08 |
| සංචාරක සේවා සපයන්නන් | දික්වැල්ල | අගෝස්තු 30 |
| අවිධිමත් සංචාරක සේවා සපයන්නන් | | සැප්තැම්බර් 11, 12, 13 |

අවිධිමත් සංචාරක සේවා සපයන්නන් විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ලියාපදිංචි නොවූ සංචාරක සේවා විධිමත් අංශයට ඇතුල්කර ගැනීම සඳහා කටයුතු කිහිපයක්ම ආරම්භ කළේය. එබැවින් සංචාරක අංශය ක්‍රියාත්මක කර තිබෙන මාර්ගෝපදේශ සහ එකඟ වී ඇති අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වීම සියලුම සංචාරක සේවා සපයන්නන්ගේ වගකීම වේ.

පවත්වන ලද ජංගම සංචාරක සේවා පිළිබඳ විස්තරය

| ස්ථානය | දිනය |
|---|---|
| දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය, යාපනය | මැයි 29, 30 |
| මිරිස්ස | ජුනි 3, 4 |
| සීගිරිය සහ දඹුල්ල | අගෝස්තු 2, 3, 4 |
| තංගල්ල | ඔක්තෝබර් 25, 26 |





## 4.6 විශේෂ සිදුවීම්

- සංචාරකයන්ට වඩාත් පහසු ටුක් ටුක් ප්‍රවාහන සේවාවක් 2018 ජූලි 30 වන දින ගාලු මුවදොර දී ආරම්භ කරන ලදී.
- 2018 සැප්තැම්බර් 25 සහ 28 අතර යාපනයේදී පැවති ලෝක සංචාරක දින සැමරුම් උත්සවයට සහභාගි විය.
- ජාත්‍යන්තර සහතික කිරීමට සම්බන්ධ ජලය ආශ්‍රිත ත්‍රාසජනක සංචාරක කටයුතු පිළිබඳ දැනුම්වත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ එක්ව ලංකා ස්පෝට් රයිසන් (LSR) මඟින් පාසිකුඩාහිදී පවත්වන ලදී.

## 4.7 ශ්‍රී ලංකා සංචාරක තිලිණ - 2018

සංචාරක ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීමට දායක විය හැකි සංචාරකයින් සඳහා ලබාදෙන සේවාවන් වල ගුණාත්මකභාවය වැඩිකිරීමට සහ ඒ සඳහා උනන්දු කිරීම වෙනුවෙන් විශිෂ්ඨ සංචාරක සේවා හඳුනාගැනීම සහ ඒ සඳහා තිලිණ පිරිනැම්මේ වැඩසටහනක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2007 දී ආරම්භ කරන ලදී.

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධක අධිකාරිය විශිෂ්ඨතාවය විනිශ්චය කිරීමේ ක්‍රමවේදයට නව පෙනුමක්, අමතර අංග සහ විනිවිදභාවය ඇතිකිරීම සඳහා වෙනස්කම් ගණනාවක් ඇති කළේය. ඒ අනුව මාර්ගෝපදේශ සහ නැවත සලකා බලා අවශ්‍ය වෙනස්කම් කිරීමට කටයුතු කළේය. සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රධාන අංශයෙන් ඉල්ලුම්පත්‍ර 03 ක් සහ උප අංශවලින් ඉල්ලුම්පත්‍ර 43 ක් වශයෙන් ඉල්ලුම් පත්‍ර 127 ලැබුණි. ජයග්‍රහකයින් 36 තෝරා ගත් අතර ඔවුන්ට තිලිණ ප්‍රධානය කළේය.

තිලිණ ප්‍රදානය කිරීමේ උත්සවය ආරාධිතයින් සහ අනිකුත් අමුත්තන් 400ට වැඩි සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් 2018 දෙසැම්බර් 06 දින ෂැන්ග්‍රිලා හෝටලයේ ද පැවැත්විණි.

සංචාරක අංශයේ පාර්ශවකරුවන් රාශියක් මෙම උත්සවය, වර්ෂයේ හොඳම සංචාරක අංශයේ උත්සවය වශයෙන් හැඳින්වූයේය. ඉල්ලුම් පත්‍ර ඇගයීම සහ ජයග්‍රාහයකයන් තෝරාගැනීම විනිශ්චය මණ්ඩල තුනක් යටතේ සිදුකෙරුනු අතර විනිවිදභාවය තවදුරටත් තහවුරු කිරීම සඳහා අර්නස්ට් සහ යංග් (විගණකවරුන්) තෝරා ගැනීමේදී සම්බන්ධ විය.

## 4.8 ජාතික තිරසර සංචාරක සහතිකපත් පිරිනැමීමේ වැඩපිළිවෙල

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වූ ජෛව විවිධත්ව මූල්‍ය වැඩසටහන (BIOFN) සමඟ එක්ව ජාතික තිරසාර සංචාරක සහතික කිරීමේ වැඩසටහන් ව්‍යාපෘතිය (NSTC) ආරම්භකරන ලදී. තිරසාර සංචාරක ස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීම සඳහා මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දේශීයව සහ ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී ලෙස ඉහළ නැංවීම සඳහා මෙම ජාතික තිරසර සංචාරක සහතික කිරීමේ වැඩසටහන වැදගත් මුලපිරීමකි.

ආරම්භයේදී සහතික කිරීමේ වැඩසටහන තෝරාගත් නවාතැන් සැපයීමේ ස්ථානවලත් පසුව සම්පූර්ණ සංචාරක නවාතැන් පහසුකම් අංශයෙන් ක්‍රියාත්මක කරන අතර අවසානයේ සංචාරක පහසුකම් සපයන සියලුම අංශ සඳහා මෙම සහතික කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත.

සංචාරක කර්මාන්තය පුරා පැතුරුණු සහතික කිරීමේ වැඩපිළිවෙළ සඳහා මූලික පියවර වශයෙන් නියමු ව්‍යාපෘතියන් ලෙස නවාතැන සැපයීමේ අංශය සහතික කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ජෛව විවිධත්ව මූල්‍ය වැඩසටහන සමඟ සහයෝගිතාවයන් ඇතිකර ගැනීමෙන් මෙයට අදාළ මූලික කටයුතු ආරම්භ විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සියලුම ප්‍රධාන සංචාරක කටයුතුවල නියැලි කොටස්කරුවන් සමඟ තිරසර සංචාරක සහතික කිරීමේ වැඩසටහනට අදාළ කටයුතු කෙටුම්පත් කිරීම සලසා වැඩමුළුවක් 2018 මැයි 10 දින පැවැත්විය.





වැඩමුළුවේ ප්‍රතිඵලය වූයේ ගෝලීය තිරසාර සංචාරක සභාවට අනුගාමීව තිරසර සංචාරක සභාව පිහිටුවීම සඳහා එකඟතාවයන්ට පැමිණීමය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ගෝලීය තිරසාර සංචාරක සභාව සමඟ එක්ව නොවැම්බර් මාසයේදී පුහුණු වැඩසටහනක් පැවැත්වීය. ගෝලීය තිරසාර සංචාරක සභාවේ ආසියානු පැසිපික් කලාපීය අධ්‍යක්ෂිකා මිහී මෙනවිය කෑන්ග් මිය පුහුණු වැඩසටහන සඳහා පහසුකම් සැලසීය. හෝටල් හිමිකරුවන්, රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික නිලධාරීන් සහ ප්‍රධාන පාර්ශවකරුවන් වැනි මෙම පුහුනු වැඩ පවත්වන්නට සහභාගි විය.





## 5. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

තොරතුරු සහ සන්නිවේදන අංශය (ICT) 2018 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති සම්පූර්ණ කරන ලදී. තාක්ෂණික අභිවර්ධන තුළින් උපරිම වාසිය ලබාගනිමින් මෙම ව්‍යාපෘති ශ්‍රී ලංකාව, කලාපයේ සහ ලෝකයේ වෙනත් සංචාරක ගමනාන්තවලට වඩා තරගකාරී වාසියක් අත්පත් කරගනු ලබන සහ පවත්වාගනු ලබන සංචාරක ගමනාන්තයක් (සංචාරක කර්මාන්තය ඉදිරි පරම්පරාවට ගෙනයාම) බවට පත් කරනු ඇත.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පාලන කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා මාණ්ඩලික කටයුතු කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීම
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සේවා සහ විදේශීය සංචාරක ආයෝජක ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ තිරසාර සංචාරක සහ අනිකුත් සංචාරක ව්‍යාපෘති පාලනය සඳහා ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංග ආශ්‍රිත තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම.

ඊට අමතරව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය 2018 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති ද ආරම්භ කරන ලදී.

- සංචාරකයන්ට තොරතුරු සහ සේවාවන් ලබාදීම සඳහා ජංගම දුරකතන ආශ්‍රිත මෘදුකාංග හඳුන්වාදීම.
- ව්‍යාපාර බුද්ධිය සමඟ තීරණ ගැනීමට උපකාරක පද්ධති හඳුන්වාදීම.
- වර්තමාන මූල්‍ය පද්ධති, මානව සම්පත් සහ අනෙකුත් කාර්යයන් වෙනුවට නව තාක්ෂණික ව්‍යාපාර ක්‍රමවේද සමඟ සම්පත් කළමනාකරණ ක්‍රමවේද හඳුන්වා දීම.
- ආයෝජන කළමනාකරණ පද්ධති හඳුන්වා දීම
- දත්ත ගබඩා - තොරතුරු එකතු කිරීමේ සහ අන්තර්ගතය සංවර්ධනය

## 06. දේශීය සංචාරක ව්‍යාපාරය සහ ප්‍රජා සම්බන්ධතා අංශය

### 6.1 ටුක් ටුක් ආශ්‍රිත ප්‍රවාහන වැඩසටහන

ශ්‍රී ලංකාවේදී ලබාගත හැකි විශේෂිත අත්දැකීමක් වශයෙන් ටුක් ටුක් මගින් ගමන් බිමන් යෑම සැලකේ. එම නිසා ටුක් ටුක් සංචාරක සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට කොළඹ, බෙන්තොට, දෙනියාය, ඇල්ල, මීගමුව සහ තිස්සමහාරාමය යන ප්‍රදේශවලදී රුපියල් මිලියන 12 ක් වියදමින් රියදුරන් 2000 ක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් පුහුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාව පුරා ත්‍රී වීලර් රියදුරන් 10,000 ක් වරින්වර පුහුණු කිරීමට සැලසුම් කර තිබේ.




### 6.2 ජීවිත ආරක්ෂක ඒකක

වෙරළ ආරක්ෂිත දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් විශේෂයෙන් වෙරළ ආශ්‍රිත ප්‍රදේශවල ජීවිත ආරක්ෂක ඒකක 25 ඇති කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කටයුතු ආරම්භ කර ඇත. මෙහි ප්‍රථම පියවර වශයෙන් බෙන්තොට හික්කඩුව සහ මිරිස්ස ප්‍රදේශවල දැනටමත් පිහිටුවා තිබෙන ජීවිත ආරක්ෂක ඒකක වැඩි දියුණු කිරීමට කටයුතු යොදා ඇත. මෙම ඒකකවලට අලුතින්ම මිලදීගත් උපකරණ සමග ඒකකයට තුනක් බැගින් ජෙට් ස්කයිස් ද ලබා දී ඇත.

### 6.3 සංචාරක පොලීසිය

රුපියල් බිලියන 80 ක වියදමින් හඳුනාගත් සංචාරක ස්ථානවල සංචාරක පොලිස් මුරපොළ 25 ක් පිහිටුවීමට සැලසුම් කර තිබේ. මෙම වැඩසටහන යටතේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් මිරිස්ස කන්ටේනර් ආශ්‍රිත සංචාරක පොලිස් ස්ථානය විවෘත කිරීමට සැලසුම් කර තිබේ.

## 7. නිවාඩු නිකේතන කළමනාකරණය

නිවාඩු නිකේතන කළමනාකරණ දෙපාර්තමේන්තුවට වෙළඳ නිවාඩු නිකේතන 4 ක් සහ වෙළඳ නොවන නිවාඩු නිකේතන 2 අයත්ව ක්‍රියාත්මකව පවතී. මීට අමතරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අමුත්තන්ගේ නිවාස 37 ක් අයත්වන අතර ඒවා කළමනාකරණය සඳහා පෞද්ගලික අංශයට ලබාදී ඇත.

### 7.1 වෙළඳ නිවාඩු නිකේතන

2018 වර්ෂයේදී මෙම නිකේතන අලුත්වැඩියා කරන ලදී. අලුත්වැඩියා කිරීමේ වැඩසටහන මගින් රෙදි සෝදන සහ වියලන යන්ත්‍ර සවිකිරීම සහ රෙදිපිළිවල සහ කෑමපිසීමට යොදාගන්නා බඩුභාණ්ඩ වල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලාංඡනය ඇතුල්කිරීමට සැලසුම්කර ඇත. මීට අමතරව විශේෂයෙන්ම දේශීය සංචාරකයන් ආකර්ෂණය කරගැනීම සඳහා දිනපතා නඩත්තු කටයුතු ඒ ඒ අවස්ථාවලදී සිදු කෙරේ.

- පසුගිය වර්ෂයට සාපේක්ෂව භාවිතය 3% න් වැඩිවීම.
- ලාභය 8% න් වැඩිවීම.
- විවාහ මංගල උත්සව සහ අනිකුත් උත්සව 25 පමණ බණ්ඩාරවෙල, නුවරඑළිය සහ නිකවැරටිය නිකේතන මගින් ඉටුකිරීම.

### 7.2 වෙළඳ නොවන නිවාඩු නිකේතන

#### පාසිකුඩා

පාසිකුඩා ප්‍රදේශයේ පිහිටි වෙළඳ නොවන ජාතික නිවාඩු නිකේතනයේ හෝටල් ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශයට ඉඩම් කැබලි 14 ක් බදු දී ඇත. මෙම ඉඩම් කැබලි 14 න් 12 ක හෝටල් ඉදිකිරීම අවසන් කර ඇති අතර දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. විදුලිය, ජලය සහ මලාපවහන ප්‍රතිකාරක පද්ධතිය ආදි මූලික යටිතල පහසුකම් පාසිකුඩා වෙළඳ නොවන ජාතික නිවාඩු නිකේතනය කාර්යක්ෂම ව කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් සපයන ලදී. මෙම නිකේතනය ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රාදේශීය ප්‍රජාව වෙත සෘජු සහ වක්‍ර ප්‍රතිලාභ රාශියක් ලැබී ඇත. තවද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වාර්ෂික බදු ගිවිසුම මගින් රුපියල් මිලියන 14.2 ක ආදායමක් උපයා ඇත.

#### බෙන්තොට

බෙන්තොට වෙළඳ නොවන නිවාඩු නිකේතනයට අදාළ යටිතල පහසුකම් සැපයීම සහ අධීක්ෂණය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් සිදුකරයි. මලාපවහන ප්‍රතිකාරක පද්ධතිය, ජල සැපයුම, වෙරළ ප්‍රදේශය ඇතුළු ප්‍රදේශය පිරිසිදු කිරීම සහ ආරක්ෂාව සැපයීම ආදී පොදු පහසුකම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සපයයි. මෙම නිකේතනයේ ඉඩම් කට්ටි 15 ක් පෞද්ගලික අංශයට සහ ඉඩම් කට්ටි 6 ක් රාජ්‍ය ආයතනවලට බදුදී ඇති අතර මෙම ඉඩම් කට්ටි බදු දීම මගින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය දළ වශයෙන් රු මිලියන 69.5 ක් උපයා ඇත.

වගුව 7.1 - 2018 වර්ෂය තුළ වෙළඳ නිවාඩු නිකේතන වල සිදුකෙරුනු සංවර්ධන කටයුතුවල සාරාංශය.

| ස්ථානය | සංවර්ධන කටයුත්ත | ප්‍රගතිය | වියදම (රු. මිලියන) |
|---|---|---|---|
| කතරගම | මලාපවහන පද්ධති නල එලීම | 2017 ඔක්. 07 ආරම්භ කර 2018 පෙබ. 15 අවසානකළේය. | 4.2 |
| | ප්‍රාග්ධන මිළදී ගැනීම් | SLTDA ලාංඡනය සමග සෝදන සහ වියලන යන්ත්‍රය, ආහාර පිසිනය, කාර්යමණ්ඩලය සඳහා පරිගණක උපකරණ, ඇඳ ඇතිරිලි, ආහාර අනුභව උපාංග සහ අනිකුත් උපකරණ | 1.5 |
| අනුරාධපුරය | සුපිරි කාමර 16 | 2017 මාර්තු 26 ආරම්භකළ අතර 2019 පෙබ. නිම කිරීමට නියමිතය. කොන්ත්‍රාත් මුදල රු. මිලි. 5 | 41.0 |
| | කාමර අංක 30-36 සහ 50-54 අලුත්වැඩියා කිරීම | 2017 ජුනි 06 ආරම්භ කළ අතර 2019 පෙබ. නිම කිරීමට නියමිතය. කොන්ත්‍රාත් මුදල රු.මිලි. 12.4 | 2.8 |
| | කාමර අංක 20-25 කාමරඅංක 1-5 සහ ආලින්දය අලුත්වැඩියා කිරීම. | 2017 ජුනි 06 ආරම්භ කළ අතර 2019 පෙබ. නිම කිරීමට නියමිතය. කොන්ත්‍රාත් මුදල රු.මිලි. 12.5 | 7.2 |
| බෙන්තොට | සාප්පු සහ වෙළඳපොළ ප්‍රදේශය සහ කාර්යාලය ආශ්‍රිත පහසුකම් දියුණුකිරීම. ආදර්ශ වෙරළ සහ විනෝද සංචාර ප්‍රදේශය ගොඩනැගීම. | | 20.8 |

| | | | |
|---|---|---|---|
| කළමනා කරු ගේ නිල නිවාස තැපැල් කාර්යාලය සහ පොලිස් ස්ථානය අලුත්වැඩියා කිරීම. | පැරණි ගොඩනැගිලි ඉවත්කිරීම සම්පූර්ණ කර ඇත. 2018 අගෝ. 13 ආරම්භ කළඅතර 2019 මැයි අවසන් කිරීමට නියමිතය. | | |
| කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. රු. මිලි.73.4 | 20.8 | | |
| | සුලන්කා ගොඩනැගිලි අලුත්වැඩියාව | 2017 දෙසැ. 15 ආරම්භ කළ අතර 2019 ජනවාරි සම්පූර්ණ කිරීමට නියමිතය. කොන්ත්‍රාත් මුදල රු. මිලි.26.2 | 18.0 |
| | ප්‍රාග්ධන මිලදී ගැනීම් | SLTDA ලාංඡනය සහිත සෝදන සහ වියලන යන්ත්‍රය, ආහාර පිසිනය, අමුත්තන්ගේ කාමරය දොර ජනේල තිරරෙදි යෙදීම. කාර්ය මණ්ඩලයට පරිගණක අනිකුත් උපකරණ, ඇඳ ඇතිරිලි, ආහාර අනුභව උපාංග සහ අනෙකුත් උපකරණ | 3.5 |
| නුවරඑළිය | ප්‍රාග්ධන මිලදී ගැනීම් | SLTDA ලාංඡනය සහිත සෝදන සහ වියලන යන්ත්‍රය, කාර්ය මණ්ඩලය සඳහා පරිගණක අනෙකුත් උපකරණ, ඇඳ ඇතිරිලි, ආහාර අනුභව උපාංග සහ අනෙකුත් උපකරණ | 1.5 |
| අනුරාධපුරය | ප්‍රාග්ධන මිලදී ගැනීම් | SLTDA ලාංඡනය සහිත සෝදන සහ වියලන යන්ත්‍රය, කාර්ය මණ්ඩලය සඳහා පරිගණක, අනෙකුත් උපකරණ, ඇඳ ඇතිරිලි, ආහාර අනුභව උපාංග සහ අනෙකුත් උපකරණ | 2.2 |

අනුරාධපුරයේ වෙළඳ නිකේතනයේ නව නවාතැන් පහසුකම්







කාමර අංක 30-36 සහ 50-54 අලුත් වැඩියා කිරීම





සුලන්කා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.





බෙන්තොට කාර්යාල සංකීර්ණය සහ ප්‍රාදේශීය සාප්පු අලුත්වැඩියා කෙරෙමින් පවතී.





## 7.3 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් පෞද්ගලික අංශයේ පාලනය යටතේ පවතින නිවාඩු නිකේතන

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය දළ වශයෙන් රු. මිලියන 13.6 බදු කුලිය වශයෙන් වාර්ෂිකව උපයයි.

- 2018 වර්ෂයේදී නිවාඩු නිකේතන පවත්වාගෙන යන තත්ත්වයන් ඇගයීමට සහ සිදුකරන ලද නව ඉදිකිරීම් කටයුතු සොයා බැලීමට නිකේතන කළමනාකරණ අංශයේ නිලධාරීන් නිවාඩු නිකේතන 18ක් පරීක්ෂාවට ලක් කරන ලදී.
- නාලන්දා රාගල සහ වීරකැටිය නිවාඩු නිකේතන කුලීපදනම යටතේ ලබාදීමට අදාළ කටයුතු ආරම්භ කර ඇත.
- බත්තුළු ඔය නිවාඩු නිකේතනය නැවත ගොඩනැගීමට කටයුතු සැලසුම් කර ඇත.

## 7.4 පළාත්බද සංචාරක කටයුතු

සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය ක්‍රියාත්මක කිරීමේ අභියෝග සහ ඉදිරි ගමන්මග පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පළාත් සභා සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් මාස 03 ට වරක් වශයෙන් 2018 වර්ෂයේදී පවත්වා ඇත.









## 7.5 ජගත් සංචාරක දිනය (WTD) - 2018

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මෙම වසරේ ජගත් සංචාරක දිනය සැප්තැම්බර් 26 සිට 28 දක්වා කාලය තුළදී යාපනයේදී සමරන ලද අතර මෙවර තේමාව වූයේ "සංචාරක කර්මාන්තය සහ ඩිජිටල් පරිවර්තනය"යන්නය. මෙය යාපනයේ දී ජාතික සැමරුම පැවති ප්‍රථම අවස්ථාව වේ.

2018 ජගත් සංචාරක දින සැමරුම් උත්සවය යටතේ ක්‍රියාත්මක වූ කටයුතු පහත සඳහන් වේ.

1. සැප්තැම්බර් 26 දින සිට 28 දින දක්වා ප්‍රදර්ශනය පළාත් සභා 9 ටම අයත් සංචාරක අංශ හෝටල් සහ උතුරු පලාතේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාවසායකයින් මෙම ප්‍රදර්ශනයට සහභාගි විය. ආහාර, රෙදිපිළි සිහිවටන සහ අත්කම් ප්‍රදර්ශන කුටි රාශියක් මෙයට ඇතුළත් විය.
2. 2018 සැප්තැම්බර් 27 දින පැවති ජගත් සංචාරක දින නිල උත්සවය : විශේෂ අමුත්තන් සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් සහ රාජ්‍ය සහ මාධ්‍ය අංශ නියෝජනය කරමින් බොහෝ දෙනෙක් මෙම නිල උත්සවයට සහභාගි විය.
3. සැප්තැම්බර් 27 දිනපැවති මාණ්ඩලික සාකච්ඡාව : මෙම වර්ෂයේ තේමාව වූ, සංචාරක කර්මාන්තය සහ ඩිජිටල් පරිවර්තනය ආශ්‍රිතව සැප්තැම්බර් 27 වන දින පස්වරුවේ මාණ්ඩලික සාකච්ඡාව පැවැත්විණි.
4. සැප්තැම්බර් 26 - 28 කාලය තුළ පැවති සංස්කෘතික දැක්ම : යාපනයේ ආවේණික සංස්කෘතිය පිළිබිඹු කෙරෙන සංස්කෘතික දැක්මක් පැවැත්විණි.

2018 ජගත් සංචාරක දින සැමරුම, උතුරු කලාපයට මහත් ප්‍රසිද්ධියක් ගෙන ආවේය. තවද උතුරු කලාපයේ සංචාරක සේවා සැපයුම්කරුවන් විවිධ සංස්කෘතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධයක් ඇති කර ගැනීම සහ යාපනයේ සංචාරක කර්මාන්තයට සම්බන්ධ ප්‍රාදේශීය සේවා සපයන්නන් අතරට ගෙන යෑමද මෙම සැමරුම මගින් සිදු විනි.





## 7.6 පළාත් සභාවල සහයෝගිත්වයෙන් විශේෂ ව්‍යාපෘති

- කොළඹ - මහනුවර මාර්ගයේ කජුගම ප්‍රදේශයේ ආකර්ෂණීය අඟල් 20"x30" ප්‍රමාණයේ වෙළඳ පුවරු සවිකිරීම සහ අඟල් 20"x30"ප්‍රමාණයේ දැන්වීම් පුවරු සවිකිරීම.



- තලෛයිමන්නාරම් නව වෙරළ සංවර්ධනය
- අම්පිටිගල, පාරිසරික සංචාරක ගම්මාන සංවර්ධනය
- සඳතැන්න (සීතා එළිය) කෘෂි සංචාරක උද්‍යානය
- අනුරාධපුර රුවන්වැලි මහා සෑය ආශ්‍රිත සනීපාරක්ෂක කටයුතු සංවර්ධනය



- දුන්හිඳ ඇල්ල යටිතල පහසුකම් සංවර්ධනය
- රාවණා ඇල්ල සංවර්ධනය



- අරුගම්බේ කොට්ටුකල් මාර්ගය (කි.මී.4) පුළුල් කර වැඩි දියුණුකිරීම.



- තිස්සමහාරාමය, අලුත්නුවර, ගැටබරුව සහ මදුරන්කුලිය සුවපහසු මධ්‍යස්ථාන

## 7.7 ප්‍රජා සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති

- සංචාරක ව්‍යාපාර කොටස්කරුවන් සඳහා දැනුම්වත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්





මින්නේරිය සෆාරි වාහන රියදුරන් පුහුණු වැඩසටහන්

- සංචාරක ව්‍යාපාර කොටස්කරුවන් සඳහා දැනුම්වත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්





- ආගමික උත්සව සඳහා මූල්‍ය සහය

සංස්කෘතික සංචාරක කර්මාන්තයේ කොටසක් වශයෙන් පෙරහැර ශ්‍රී ලාංකීය සංස්කෘතියේ සහ සම්ප්‍රදායේ ප්‍රධාන අංගයකි. සංස්කෘතික සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පෙරහැර උත්සව 13 ක් සඳහා මූල්‍ය ආධාර සැපයීය.

උදාහරණ වශයෙන් කැළණිය පෙරහැර, ගංගාරාම පෙරහැර, බෙන්තොට ගලපාත විහාර පෙරහැර, බෙල්ලන්විල පෙරහැර සහ කෝට්ටේ රජමහා විහාර පෙරහැර දැක්විය හැක.

# 8. මානව සම්පත් සහ ආයතන කළමනාකරණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2018 වර්ෂයේදී ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුන්වා දෙමින් විශිෂ්ඨ කාර්ය සාධනයක් ඇතිකිරීමට අවශ්‍ය ආයතනික වටපිටාවක් ඇති කිරීමට කැපවීය.

පෙර වර්ෂයට වඩා 9% ක වැඩිවීමත් සමඟ 2018 වර්ෂයේ දී කාර්ය මණ්ඩලය 193 කි. මුළු කාර්ය මණ්ඩලයේ 59% න් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි අවු. 10 ට වැඩි කාලයක් ද 44% ක් වයස අවු. 36 - 45 අතර ද 30% ක් කාන්තාවන් ද වාර්ෂික කාර්යමණ්ඩල පිරිවැටුප 4% ක් ද විය.

2018 වර්ෂය තුළදී මුළු සේවකයන්ගෙන් 57% ක් වන 110 පුහුණු වැඩසටහන් සඳහා යවා ඇත. පුහුණු පැය 5225 පුහුණු වැඩසටහන් තුළ ආවරණයකර ඇත. පුහුණු වැඩසටහන් වෙනුවෙන් රු. මිලි 5.5% ක් වැය වී ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සුභසාධන සමිතිය ක්‍රීඩා, ආගමික වටිනාකම් සහ සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කළේය.















වගුව 8.1 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අරමුදල රු මිලියන, 2016, 2017 සහ 2018

| කාණ්ඩය | 2016 (රු. මිලියන) | 2017 (රු. මිලියන) | 2018 (රු. මිලියන) |
|---|---|---|---|
| ගුවන් තොටුපොළ බද්ද | 2,355.44 | 2,378.83 | 2,824.97 |
| සංචාරක සංවර්ධන බද්ද | 1,276.81 | 1,541.47 | 1,482.08 |
| අනෙකුත් ආදායම් | 11.90 | 12.34 | 11.08 |
| එකතුව | 3,644.15 | 3,932.64 | 4,318.13 |

## 9. නීති අංශය

නීති අංශය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සියලුම අංශවලට දිනපතා නීතිමය උපදෙස් සපයයි. කළමනාකරණ මණ්ඩලයේ ලේකම්වරයා නීති නිලධාරියා වශයෙන් කටයුතු කරයි.

2018 වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ විශේෂ කටයුතු

- හෝටල් වර්ගීකරණ නීති සංග්‍රහය ගැසට් කිරීම.
- සංචාරක සේවා සහ සංචාරක කර්මාන්ත බලපත්‍ර සඳහා ලබාදීමට අදාළ නීති ගැසට් කිරීම.
- සංචාරක සේවා සහ සංචාරක කර්මාන්ත සඳහා වන 48(1) වගන්තිය යටතේ වන නියෝගය ගැසට් කිරීම.
- බදු එකඟතාවය, සේවා එකඟතාවය සහ සේවා කොන්ත්‍රාත්තු ඇතුළු එකඟතා 21 ක් ක්‍රියාත්මක කිරීම.

## 10. අභ්‍යන්තර විගණන අංශය

2018 වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන වාර්තා 21 සහ වෙනත් සමීක්ෂණ වාර්තා 11, ඉදිරි සංවර්ධනයට අදාළ යෝජනා සහ නිර්දේශ සහිතව නිකුත්කර ඇත. අදාළ නිලධාරීන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග තුළින් ඵලදායි අභ්‍යන්තර විගණන නිලධාරි කාර්තු විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් මෙම වර්ෂය තුළදී කැඳවා ඇත.

## 11. මූල්‍ය කළමනාකරණය

භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලැබෙන මූල්‍ය ප්‍රමාණයන් මත රඳා නොසිට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අවශ්‍ය මුදල් ඔවුන්ම සම්පාදනය කර ගනී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ එක් කාර්යභාරයක් වන්නේ 2003 අංක 25 දරන මුදල් පනතට අනුව සංචාරක සංවර්ධන බදු මුදල් රැස් කිරීමයි. සංචාරක සංවර්ධන අරමුදල, සංචාරක සංවර්ධන බදු සහ ගුවන් තොටුපොළ බද්දෙන් සමන්විත වේ. 2005 අංක 38 දරන සංචාරක පනතේ 23(1) දරන ඡේදයට අනුව සංචාරක සංවර්ධන අරමුදල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට 14% ද ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට සියයට 70% ද ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයට 12% ද සහ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය 04% ද වශයෙන් බෙදී යයි.

**2016 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඉපයූ ආදායම වූ රු. බිලයන 3.64, 2017 වර්ෂයේදී රු. බිලයන 3.93 දක්වාත් 2018 වර්ෂයේදී රු. බිලයන 4.32 දක්වාත් වර්ධනය වී ඇත.**

## කෙටියෙදුම්

| | |
|---|---|
| BOI | - Board of Investment of Sri Lanka<br>- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය |
| ICT | - Information and communication technology - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| IRU | - Investor Relations Unit<br>- ආයෝජක සම්බන්ධතා ඒකකය |
| MOU | - Memorandum of Understanding<br>- අවබෝධතා ගිවිසුම |
| SAIL | - Supporting Accelerating Investment in Sri Lanka - ශ්‍රී ලංකා ආයෝජන දිරිගැන්වීම් සහයෝගිතාව |
| SLTDA | - Sri Lanka Tourism Development Authority - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය |
| UDA | - Urban Development Authority<br>- නාගරික සංවර්ධන අධිකාරිය |

# 12. මූල්‍ය ප්‍රකාශන 2018

## පටුන


| | පිටු අංකය |
|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ........................................................... | **40** |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ...................................................... | **41** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........................................................................ | **42-43** |
| සමානාත්මතාවයේ වෙනස්කම් ප්‍රකාශය ........................................................ | **44** |
| ගිණුම් වලට සටහන් ............................................................................. | **46-60** |
| **ඇමුණුම් :** | |
| දේශීය සංචාරක නිකේතන | |
| නිකේතන මෙහෙයුම් සාරාංශය ............................................................. | **61** |
| ජාතික නිවාඩු නිකේතනය – දේශීය සංචාරක කර්මන්තය | |
| කතරගම ........................................................................................ | **62** |
| නුවරඑළිය...................................................................................... | **63** |
| බණ්ඩාරවෙල...................................................................................... | **64** |
| අනුරාධපුර.................................................................................... | **65** |
| ජාතික නිවාඩු නිකේතන - සේවා සහ කුලී ආදායම් උත්පාදනය | |
| බෙන්තොට ........................................................................................... | **66** |
| පොළොන්නරුව / කල්කුඩා ...................................................................... | **67** |
| අයවැය සහ නත්‍ය දත්ත සංසන්දය ..................................................................... | **68-69** |
| විගණන වාර්තාව.......................................................................................... | **70-76** |






2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2018 (රු.) | නැවත ප්‍රකාශ කරන ලද 2017 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 4 | 1,569,193,546 | 1,298,200,564 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | 5 | 648,030,103 | 501,084,787 |
| තොග | | 3,541,985 | 2,343,317 |
| **අනෙකුත් ජංගම වත්කම්** | 6 | 419,010,016 | 390,775,724 |
| මුළු ජංගම වත්කම් | | **2,639,775,650** | **2,192,404,392** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 7.1 | 1,999,959,548 | 2,018,341,813 |
| නොනිමි වැඩ | 8 | 428,188,502 | 340,100,479 |
| අස්පෘශ්‍ය වත්කම් (සංවර්ධන පිරිවැය) | 7.2 | 16,538,109 | 107,445,505 |
| පුස්තකාල පොත් | | 1,880,781 | 1,880,781 |
| දිගු කාලීන ආයෝජන | 9 | 80,948,937 | 80,113,238 |
| මුළු ජංගම නොවන වත්කම් | | **2,527,515,877** | **2,547,881,816** |
| මුළු වත්කම් | | **5,167,291,527** | **4,740,286,208** |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 10 | 246,400,187 | 190,993,130 |
| එකතු කළ අගය මත බදු (VAT) | | | 4,423,106 |
| කලින් ලද අයභාරය | | 29,208,712 | 4,127,139 |
| උපචිත වියදම් | | 54,667,976 | 45,725,364 |
| කල් බදු හිමියන් | 11 | - | 1,649,303 |
| **මුළු ජංගම වගකීම්** | | **330,276,875** | **246,918,042** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 12 | 54,442,742 | 52,023,039 |
| | | **54,442,742** | **52,023,039** |
| මුළු ජංගම නොවන වගකීම් | | **4,782,571,910** | **4,441,345,127** |
| **ශුද්ධ වත්කම්** | | | |
| රාජ්‍ය ගිණුම | | 14,272,174 | 14,272,174 |
| ප්‍රාග්ධන සංචිත | | (243,736,884) | (243,736,884) |
| කල්පිටිය ව්‍යාපෘති හිමිකම | | 46,517,800 | 46,736,460 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 945,835,504 | 945,835,504 |
| ප්‍රාග්ධන දායකත්වය | | 1,636,043,833 | 1,636,043,833 |
| අයභාර ගිණුම | | 2,381,950,462 | 2,040,505,019 |
| නිදන් අරමුදල | | 759,021 | 759,021 |
| සංචාරක අරමුදල | | 930,000 | 930,000 |
| මුළු ශුද්ධ වත්කම් | | **4,782,571,910** | **4,441,345,127** |

සම්පත් ගනේපලආරච්චි
අධ්‍යක්ෂ/මූල්‍ය කළමනාකරණ

පිටු අංක 6 සිට 10 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා 11 පිටුවේ සිට 31 දක්වා ඇති සටහන් යනු මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කරසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| පී.යූ.රත්නායක<br>අධ්‍යක්ෂ/ජනරාල් | එච්.කේ.පී.කේ.ගෝමස්<br>සභාපති | එම්.ශාන්ති කුමාර්<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2018 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | සටහන | 2018 (රු.) | නැවත ප්‍රකාශ කරන ලද 2017 (රු.) |
|---|---|---|---|
| **අයභාරය** | | | |
| අපගමන බදු | 13 | 395,495,778 | 333,035,950 |
| සංචාරක සංවර්ධන බදු | 14 | 262,575,086 | 216,601,229 |
| ගාස්තු හා බලපත්‍ර ගාස්තු | 15 | 129,295,690 | 186,924,368 |
| නිකේතන මෙහෙයුම් ඌනතාවය/ අතිරික්තය | 16 | 31,089,825 | (3,391,757) |
| වෙනත් ආදායම් | 17 | 88,475,834 | 65,437,350 |
| **මුළු අයභාරය** | | **906,932,213** | **798,607,139** |
| **වියදම්** | | | |
| වැටුප් , වේතන හා සේවක ප්‍රතිලාභ | 18 | 147,797,135 | 145,985,936 |
| සැපයුම් හා භාවිතා කළ පාරිභෝජනය කළදෑ | 19 | 97,942,720 | 83,592,027 |
| වෙළඳ වියදම් | 20 | 176,469,473 | 89,203,117 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය - වියදම් | | 34,378,475 | 28,211,979 |
| වෙනත් වියදම් | 21 | 13,729,194 | 46,855,500 |
| මුල්‍ය වියදම් | 22 | 710,790 | 935,895 |
| **මුළු වියදම්** | | **471,027,789** | **349,472,886** |
| කාලපරිච්ඡේදය සඳහා බදු පෙර අතිරික්තය | | 435,904,424 | 449,134,253 |
| බදු වියදම් | | 14,478,365 | 12,575,899 |
| **කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය** | | **421,426,059** | **436,558,354** |

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2018 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2018 (රු.) | | නැවත ප්‍රකාශ කරන ලද 2017 (රු.) |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මුදල් ප්‍රවාහයන්** | | | | |
| බදු පෙර කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය | | 435,904,424 | | 449,134,253 |
| **ගැලපුම්** | | | | |
| ක්ෂයවීම් | 63,545,572 | | 28,211,979 | |
| විනිමය අනුපාත අලාභ | - | | 2,226 | |
| අවිනිශ්චිත පොලී වියදම | 524,373 | | 771,724 | |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | 2,555,536 | | 49,308 | |
| පෙර වසරේ වැරදි නිවැරදි කිරීම - සංචාරක සංවර්ධන බදු | (53,476,208) | | (5,176,908) | |
| උපචිත වියදම් අධිවෙන්කිරීම් ගැලපුම් | (19,740,544) | | (10,550,022) | |
| සේවක ණය හා තැන්පතු පොලි | (618,413) | | (584,499) | |
| වත්කම් විකිණීමේ ලාභ | (4,172,060) | | (4,301,578) | |
| බැංකු පොලී ලැබීම් | (50,694,365) | | (44,423,748) | |
| ලාභාංශ ලැබීම් | (400,000) | | (400,000) | |
| පෙර වසරේ වියදම් | 11,058,987 | | | |
| පාරිතෝෂික වෙන්කිරීම | 6,018,624 | (45,398,498) | 4,019,114 | (32,382,404) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | | **390,505,926** | | **416,751,849** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | | | |
| (වැඩිවීම/අඩුවීම) තොග | (1,198,668) | | (77,004) | |
| (වැඩිවීම/අඩුවීම) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | (146,945,316) | | (99,926,866) | |
| (වැඩිවීම/අඩුවීම) අනෙකුත් ජංගම වත්කම් | (28,234,291) | | (107,784,608) | |
| (වැඩිවීම/අඩුවීම) වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 55,407,057 | | 56,683,843 | |
| (වැඩිවීම/අඩුවීම) ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | (4,423,106) | | 4,209,142 | |
| (වැඩිවීම/අඩුවීම) ඉදිරියට ලැබූ ආදායම | 25,081,573 | | (23,245,720) | |
| (වැඩිවීම/අඩුවීම) පෙර වර්ෂ සඳහා ගෙවූ සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල | | | (51,019,696) | |
| (වැඩිවීම/අඩුවීම) උපචිත වියදම් | 8,942,612 | (91,370,139) | (432,349) | (221,593,258) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | 299,135,787 | | 195,158,591 |
| පාරිතෝෂික ගෙවීම් | (3,598,921) | | (6,200,796) | |
| බදු ගෙවීම් | (14,478,365) | (18,077,286) | (18,754,594) | (24,955,390) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **281,058,501** | | **170,203,201** |
| **ආයෝජන ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහය** | | | | |
| කාර්යය මණ්ඩල ණය හා තැන්පතු පොලී | 618,413 | | 584,499 | |

| | | | | |
|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | 18,382,264 | | (33,363,038) | |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම | 4,571,111 | | 68,100,624 | |
| ලාභාංශ ලැබීම් | 400,000 | | 400,000 | |
| දිගුකාලින ආයෝජන වැඩිවීම | (835,699) | | (840,573) | |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනමය | (82,028,011) | | (24,624,448) | |
| පොලි ආදායම් ලැබීම් | 50,694,365 | | 44,423,748 | |
| **ආයොජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(8,197,557)** | | **54,680,812** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | | | |
| කල්පිටිය හිමිකමේ අඩුවීම | (218,660) | | 2,497,991 | |
| මූල්‍ය කල්බදු වාරික ගෙවීම | (1,649,303) | | (9,340,254) | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(1,867,963)** | | **(6,842,263)** |
| **කාලච්ඡේදයේ මුදල් හා මුදල් වලට සමාන දෑ හි ශුද්ධ වෙනස** | | **270,992,981** | | **218,041,750** |
| **කාලපරිච්ඡේද ආරම්භයේ මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **1,298,200,565** | | **1,080,158,814** |
| **කාලපරිච්ඡේද අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **1,569,193,546** | | **1,298,200,564** |

## Sri Lanka Tourism Development Authority
## Statements of Changes in Equity for the year ended 31 December, 2018

| | Government Account | Capital Reserves | Kalpitiya Equity | Revaluation Reserve | Capital Contribution | Revenue Account | Sinking Fund | Tourism Fund | Total |
|---|---|---|---|---|---|---|---|---|---|
| **Balance as at 01 January 2018** | **14,272,174** | **(243,736,884)** | **46,736,460** | **945,835,504** | **1,636,043,833** | **2,091,651,647** | **759,021** | **930,000** | **4,492,491,755** |
| | | | | | | | | | - |
| **Prior Year Adjustment** | | | | | | | | | - |
| Transfer of VAT over receipts amounts due to changes of VAT rates 2010-2016 | | | | | | 133,847 | | | 133,847 |
| Transfer of VAT over receipts amounts due to changes of VAT rates during 2016 | | | | | | 80,030 | | | 80,030 |
| Correction of Income over recognision relevant to TDL | | | | | | (141,664) | | | (141,664) |
| Correction of Over provision of Gratuity for resigned emplyee | | | | | | 68,036 | | | 68,036 |
| Correction of provision for the depreciation as per the audit observation | | | | | | (87,063,978) | | | (87,063,978) |
| Correction of EPF and ETF payment reporting as per the audit observation | | | | | | (51,019,696) | | | (51,019,696) |
| Recognizing of Domestic Tourism Expendiure | | | | | | (818,144) | | | (818,144) |
| Reversal of Accrued Expenditure over provision before the year 2017 | | | | | | 7,695,461 | | | 7,695,461 |
| Correction of settlement of debtor balances realised in year 2017 | | | | | | (61,136) | | | (61,136) |
| **Adjusted Balance as at 01 January 2018** | **14,272,174** | **(243,736,884)** | **46,736,460** | **945,835,504** | **1,636,043,833** | **1,960,524,403** | **759,021** | **930,000** | 4,361,364,511 |
| | | | | | | | | | - |
| **Adjustment to year 2018** | | | | | | | | | - |
| Changes in Net Equity | | | (218,660) | | | | | | |
| Surplus for the year 2018 | | | | | | 421,426,059 | | | 421,426,059 |
| **Balance as at 31 December 2018** | **14,272,174** | **(243,736,884)** | **46,517,800** | **945,835,504** | **1,636,043,833** | **2,381,950,461** | **759,021** | **930,000** | **4,782,571,910** |

## Sri Lanka Tourism Development Authority

## Statements of Changes in Equity for the year ended 31 December, 2017

| | Government Account | Capital Reserves | Kalpitiya Equity | Revaluation Reserve | Capital Contribution | Revenue Account Restated | Sinking Fund | Tourism Fund | Total |
|---|---|---|---|---|---|---|---|---|---|
| **Balance as at 01 January 2017** | **14,272,174** | **(243,736,884)** | **93,480,042** | **945,835,504** | **1,636,043,833** | **1,587,865,166** | **759,021** | **930,000** | **4,035,448,856** |
| | | | | | | | | | - |
| **Prior Year Adjustment** | | | | | | | | | - |
| Transfer of Tourism Development Expenditure | | | | | | (47,494,319) | | | (47,494,319) |
| Transfer of Accumilated Depreciation Incurred in Development Cost | | | | | | 114,595,514 | | | 114,595,514 |
| Prior prior year adjusment | | | | | | 126,932 | | | 126,932 |
| **Adjusted Balance as at 01 January 2017** | **14,272,174** | **(243,736,884)** | **93,480,042** | **945,835,504** | **1,636,043,833** | **1,655,093,293** | **759,021** | **930,000** | **4,102,550,051** |
| | | | | | | | | | - |
| **Adjustment to year 2017** | | | | | | | | | - |
| Changes in Equity Contribution | | | 28,595,894 | | | | | | |
| Changes in Net Equity | | | (75,339,475) | | | | | | |
| Profit for the year 2017 | | | | | | 436,558,354 | | | 436,558,354 |
| **Balance as at 31 December 2017** | **14,272,174** | **(243,736,884)** | **46,736,461** | **945,835,504** | **1,636,043,833** | **2,091,651,647** | **759,021** | **930,000** | **4,492,491,756** |

# 1. ගිණුම් සඳහා සටහන්

## 1. සමාන්‍ය තොරතුරු

### නම

### ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) යනු ශ්‍රී ලංකාවේ ප්‍රධාන සේවා අංශයක් වන සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛතම ආර්ථික සංවර්ධන ආයතනයයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහයෝගිතාව, නවෝත්පාදන හා විශිෂ්ඨත්වය මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ පුළුල් දැක්මක් සහිතව විශිෂ්ඨතමයා ලෙසින් හඳුනාගනී.

**නෛතික පසුබිම**

2005 අංක 38 දරන සංචාරක පනතින් සංස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි.

**ප්‍රධාන කාර්යාලයේ ලිපිනය**

අංක.80, ගාලු පාර, කොළඹ - 03

**ජාතික නිවාඩු නිකේතන - දේශීය සංචරන**

අනුරාධපුර , බණ්ඩාරවෙල , බෙන්තොට , කතරගම සහ නුවරඑළිය

**ජාතික නිවාඩු නිකේතන - සේවා සහ කුළි ආදායම් උත්පාදන**

පාසිකුඩා , කුච්චවේලි , කල්පිටිය , බෙන්තොට ,ගිරිතලේ , පොලොන්නරුව සහ යාල

## 2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

**2.01 ඉදිරිපත් කිරීම හා ව්‍යාවහාරික මුදල්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය අගයන් ආසන්න රුපියලට වටලා ඇත.

**2.02 අඛණ්ඩ පැවැත්ම සංකල්පය**

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්වීම පිලිබඳ සංකල්පය පදනම් කරගෙන සකස් කර ඇත.

## 3. වත්කම් අගය කිරීම හා ඒවායේ මිණුම් පදනම

### 3.01 ඉන්වෙන්ට්‍රි/තොග

තොග, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් අඩු අගයට මැනිය යුතු වේ.

### 3.02 ක්ෂය වීම්

(අ) වත්කම්වල පිරිවැය හෝ ප්‍රත්‍යාගනින අගය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් කර ඇත.

| | | | |
|---|---|---|---|
| ඉඩම් | - | | ක්ෂය නොකරයි |
| ගොඩනැගිලි | - | 5% | (වසර 20) |
| මාර්ග හා සම්බන්ධිත වැඩ | - | 12.5% | (වසර 08) |
| ජල සැපයුම් හා ජල ප්‍රවාහන සැපයුම් | - | 12.5% | (වසර 08) |
| විදුලි සැපයුම් හා සම්බන්ධතා | - | 12.5% | (වසර 08) |
| දුරකථන සවිකිරීම් | - | 12.5% | (වසර 08) |
| උපාංග සවිකිරීම් | - | 10% | (වසර 10) |
| ලී බඩු | - | 10% | (වසර 10) |
| විවිධ උපකරණ | - | 10% | (වසර 10) |
| පිරියත යන්ත්‍රෝපකරණ | - | 20% | (වසර 05) |
| මෝටර් රථ | - | 20% | (වසර 05) |
| දන්ත සැකසුම් උපකරණ | - | 20% | (වසර 05) |
| වීදුරු භාණ්ඩ හා පිඟන් භාණ්ඩ | - | 33 1/3% | (වසර 03) |
| හැඳි ගෑරුප්පු ආදි අයිතම | - | 25% | (වසර 04) |
| ඇතිරිලි | - | 50% | (වසර 02) |
| යෙදවුම් මෘදුකාංග | - | 50% | (වසර 02) |
| සංවර්ධන වියදම් | - | 10% | (වසර 10) |

ක්ෂය කිරීම් ආරම්භය වත්කම භාවිතයට පවතින අවස්ථාවේ සිට සිදු කරනු ලැබේ.

**(ආ) යෙදවුම් මෘදුකාංග**

කාර්යාලීය මෙහෙයුම් මෘදුකාංග සහ බලපත්‍ර ලියාපදිංචි කිරීමට යොදන මෘදුකාංග මෙයට ඇතුලත් වේ.

**(ඇ) ඉඩම් තක්සේරු කිරීම්**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් සියලු ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව යටතේ සිදුකරමින් පවතී. ප්‍රත්‍යාගණනය අවසන් කිරීමෙන් ලැබෙන නව වටිනාකම් ගිණුම්වලට ඇතුලත් කිරීමට අපේක්ෂා කෙරේ.

### 3.03 කල්බදු පදනම මත වත්කම්

**(අ) මෙහෙයුම් කල්බදු මත වත්කම්**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් රජයේ ඉඩම් හා නිවාඩු නිකේතන රජයේ පිළි-වෙත් අනුගමනය කිරීමෙන් පසු විධිමත් කල්බදු ගිවිසුමකට ඇතුලත් වීමෙන් මෙහෙයුම් කල්බදු පදනම මත බදු දී ඇත.

1995 ජුලි 12 දිනැති ජනාධිපති චක්‍රලේඛය අනුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද තක්සේරුව මත ඉඩම්වල වටිනාකමෙන් 4% කට ( SEI/A/4/34) සමාන අගයක් මාසික කුලිය ලෙස ගණනය කෙරේ. සරල මාර්ග ක්‍රමය මත පදනම් ව මෙහෙයුම් කල්බදු ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ.

(ආ) මූල්‍ය කල්බදු

2014 මුදල් වර්ෂය තුළ ලංකා බැංකුව විසින් සපයනු ලබන මූල්‍ය කල්බදු පහසුකම යටතේ අධිකාරිය මෝටර් රථ පහක් (05) ලබා ගත්තේය. කල්බදු කාලය වසර හතරකි (මාස 48).කල්බදු වත්කම් ඒවායේ සාධරණ අගය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන ඇත.

කල්බදු ගිවිසුම් කාලය 2018 වර්ෂය තුලදී අවසන්ව ඇති බැවින් මෙම කල්බදු ගිවිසුම් අවලංගු වූ අතර ඒවායෙහි හිමිකම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

### 3.04 අඩමාන ණය සඳහා ප්‍රතිපාදන

වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වල වටිනාකමින් කුලී අත්තිකාරම් අඩුකල පසු සහ පසුගිය ගෙවීම් රටාව සැලකිල්ලට ගනිමින් අඩමාන ණය සඳහා පහත පරිදි ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| වර්ෂ 1 කට වැඩි වර්ෂ 2ට අඩු | - | වෙන්කිරීමක් නොමැත |
| වර්ෂ 2ට වැඩි වර්ෂ 3ට අඩු | - | 05% |
| වර්ෂ 3ට වැඩි වර්ෂ 4ට අඩු | - | 25% |
| වර්ෂ 4 කට වැඩි | - | 50% |

### 3.05 අසම්භාව්‍ය වගකීම්

S.L.P.S.A.S.8 ප්‍රකාරව හෙළිදරව් කිරීම් සඳහා අසම්භාව්‍ය වගකීම් කිසිවක් නොමැත.

### 3.06 බදුකරණය

1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ අංක 8 (අ) වගන්තිය යටතේ ආදායම් බදු බද්දෙන් නිදහස් කර ඇත.කෙසේවෙතත් 2002 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනත අනුව පොලී සහ ලාභාංශ ආදායම මත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ආදායම බද්දට යටත් වේ.

### 3.07 විදේශ විනිමය ගණුදෙනු

මෙම ගණුදෙනු පහත දැක්වෙන අනුපාත මත පරිවර්තනය වේ.

| | | |
|---|---|---|
| ලැබීම් සහ ගෙවීම් | - | සත්‍ය |
| ප්‍රේෂණය | - | සත්‍ය |

### 3.08 දායක සැලැස්ම

නිශ්චිත දායක මුදල් සැලැස්මක් යනු යම් ආයතනයකින් ස්ථාවර දායක මුදලක් වෙනම ආයතනයකට ගෙවන සහ එම මුදල් වලින් ඉවත් වූ සේවකයිනට ගෙවන ප්‍රතිලාභ සැලසුමකි. සේවයේ නියුක්තව සිටි පරිච්ඡේදයට අදාලව මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයන්හි සේවක ප්‍රතිලාභ, ප්‍රතිලාභ ලෙස අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම් වලට දායකවීම සඳහා වගකීම් හඳුනා ගැනේ.

**(අ) සේවක අර්ථසාධක අරමුදල (E.P.F.)**

එක් එක් සේවකයාගේ වැටුප අනුව අනුමත අර්ථසාධක අරමුදල සඳහා අධිකාරිය සහ සේවකයින් පිළිවෙලින් 15% සහ 10% ක් බැගින් දායක වේ.

**(ආ) සේවක භාරකාර අරමුදල (E.T.F.)**

අධිකාරිය විසින් සේවක භාරකාර අරමුදලට වැටුපෙන් 3% ක දායකත්වයක් සපයයි.

### 3.09 අත්තිකාරම්

| ව්‍යාපෘති | ආරම්භක අත්තිකාරම | | වර්තමාන ශේෂය |
|---|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීම-දෙද්දුව ව්‍යාපෘතිය-(1) | 30,000,000 | - | 10,391* |
| ඉඩම් අත්පත් කර ගැනීම-දෙද්දුව ව්‍යාපෘතිය-(2) | 104,040,000 | - | 20,006,004* |
| ඉඩම් අත්පත් කර ගැනීම-කල්පිටිය ඩච්බේ-(3) | 41,000,000 | 22,812,881 | 63,812,881 |

පෞද්ගලික පාර්ශවයන්ගෙන් ඉඩම් ලබාගැනීම සඳහා බෙන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත රුපියල් 30,000,000 ක අත්තිකාරම් මුදලක් ලබා දී ඇත. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ඉඩම් හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ උපදේශනය මත ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කර ඇත.

අනෙක් අත්තිකාරම් රුපියල් 41,000,000 ක් වු අතර,එය කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පෞද්ගලික පාර්ශවයන්ගෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මුදා හරින ලදී. කල්පිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් හා මිනින්දෝරු අමාත්‍යාංශයේ සහාය ලබාගෙන පෞද්ගලික අංශයේ ඉඩම් අත්පත් කරගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

2016 වර්ෂය තුළ දෙද්දුව සංචාරක සංවර්ධන ව්‍යාපෘතියෙහි අත්පත් කරගත් ඉඩම් සඳහා ඉතිරි මුදල වන රුපියල් 104,040,000 ක මුදලක් බෙන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත මුදා හැර ඇත.

**සටහන**

ප්‍රාදේශීය ලේකම් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ හිමිකාරීත්වය තහවුරු කරන ලද ඉඩම් හිමියන් සඳහා වන්දි ගෙවීම සිදු කිරීමත් ඉතිරි ඉඩම් සඳහා ගෙවීම් කිරීමටත් නියමිතව පවති.

සමස්ත අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිම කිරීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් පැවරුම සිදු කෙරෙනු ඇත.

#### (අ) දෙද්දුව ව්‍යාපෘතිය

| | අත්තිකාරම් (1)(රු.) | අත්තිකාරම් (2)(රු.) |
|---|---|---|
| නිදහස් කර ඇති අගය | 30,000,000 | 104,035,233 |
| 2017 පෙබරවාරි දක්වා වැය කර ඇති ප්‍රමාණය | (29,896,698) | (48,784,684) |
| 2017 පෙබරවාරි පොදු අරමුදලක් සඳහා මාරු කළ අගය | 10,391 | 55,250,549 |
| පොදු අරමුදලට මාරු කිරීමෙන් පසු වියදම් | - | (35,244,545) |
| 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිය ලේකම්ගේ බෙන්තොට පොදු අරමුදලෙහි ශේෂය | 10,391 | 20,006,004 |

### 3.10 ආයෝජන

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 1991 දී රු.මිලියන 4ක ආයෝජනයක් (එක් කොටසක් රු.10 x කොටස් 400,000) ටාජ් එක්සෝටිකා සමාගමෙහි සිදු කර ඇති අතර එම සමාගමේ කොටස් ලැයිස්තුගත කර නොමැත. කොටසක ශුද්ධ පොත් වටිනාකම රු.13.82 ක් විය.

මෙයට අමතරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් රු.750,000 ක් ශ්‍රී ලංකා සංචාරක හෝටල් පුහුණු (පුද්ගලික) සමාගමෙහි ආයෝජනය කර ඇති අතර එම සමාගම වර්තමානයේ, තම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන නොයන අතර පවතින තොරතුරු අනුව ඈවර කිරීමකට ලක් කිරීමට නියමිතව පවති.

### 3.11 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

හෙළිදරව් කිරීම සඳහා කිසිදු සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක් නොපවති.

### 3.12 කෙරීගෙන යන වැඩ

කෙරීගෙන යන වැඩවලින් සමන්විත වනු ලබන්නේ ඉදිකිරීම් ව්‍යාපෘති මත වැයකළ පිරිවැය වන රු.428,188,502 ක් වේ. (සටහන් අංක 8 බලන්න)

### 3.13 සංසන්දනාත්මක තොරතුරු

පසුගිය වර්ෂයේ මුල්‍ය ප්‍රකාශයන් සමග සංසන්දනාත්මක මුල්‍ය තොරතුරු ලබා දී ඇත. පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩයන් වර්තමාන වසරට ඉදිරිපත් කිරීම අනුකූල වීම සඳහා අවශ්‍යතා මත නැවත සකස් කර ඇත.

### 3.14 හිමිකමෙහි වෙනස්වීම්

(අ) පූර්ව කාලපරිච්ඡේද ගැලපීම්

හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයෙහි පූර්ව කාලපරිච්ඡේද ගැලපීම් ලෙස හඳුනාගෙන ඇත්තේ සංචාරක සංවර්ධන වියදම හා ඊට එරෙහිව හඳුනාගෙන ඇති නැවත ගලපන ලද/ප්‍රතිවර්තනය කරන ලද ක්‍රමක්ෂය යන දෙකට අදාල ශුද්ධ වටිනාකම වන රු.67,101,195.00, ඉදිරියට ගෙන එන ලද රඳවාගත් ලාභයට ගැලපීමකි.

මේ හා සම්බන්ධ පෙර කාලපරිච්ඡේදයට අදාල මූල්‍ය කාර්‍යසාධන සංසන්දනාත්මක වටිනාකම් නැවත ප්‍රකාශ කිරීම සිදු කර නොමැත.

### 3.15 කල්පිටිය ව්‍යාපෘතිය

ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති කාර්යාලය පරිපාලනයට අදාලව ලැබු අරමුදල් සහ ගෙවීම් පහත ප්‍රකාශනය පරිදි වේ. මෙම ව්‍යාපෘතියට අදාල සියලු වියදම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලෙජරයෙහි ''කෙරීගෙන යන වැඩ ගිණුම'' තුළ වර්ගීකරණය කර ඇති අතර අරමුදල් ලැබීම් සහ ලංසු කැඳවීමේ ලිපි අළෙවියේ ආදායම පිළිවෙලින් රු.1,743,000 ක් සහ කොන්ත්‍රාත් මිලෙන් 1% කට ගණනය කළ අගය වන රු.1,500,000 ක මුදලක් වර්ගීකරණය කර ඇති අතර ඒවා කල්පිටිය හිමිකම් ගිණුම තුළ සෘජුවම හඳුනාගෙන ඇත. ඊට අමතරව සියලුම වියදම් උපචිත පදනම යටතේ හදුනා ගෙන ඇත.

## ලැබීම්

| විස්තරය | මුදල රු. |
|---|---:|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 45,680,603 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය | 47,500,000 |
| ශ්‍රී ලංකා සංචාරක හා හොටෙල් කළමනාකරණ ආයතනය | 1,800,000 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය | 600,000 |
| සීමිත කියුබෙ ලංකා ලෙෂර් ප්‍රොපටිස්.(පෞද්.)සමාගම - ලංසු මිලෙන් 1% | 1,000,000 |
| සීමිත සන් රිසෝට් ඉන්වෙස්ට්මන්ට් (පෞද්.). සමාගම - ලංසු මිලෙන් 1% | 500,000 |
| ලංසු ගාස්තුව රු.2000/- බැගින් වු | 18,000 |
| ලංසු මුදල රු.25000/- බැගින් වු | 1,725,000 |
| **එකතුව** | **98,823,603** |

## වියදම්

| විස්තරය | මුදල රු. |
|---|---:|
| වැඩසටහන්/ව්‍යාපෘති වියදම් | 66,306,642 |
| පරිපාලන වියදම් | 32,672,763 |
| ප්‍රාග්ධන වියදම් | 1,807,049 |
| **එකතුව** | **100,786,454** |

### 3.16 වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම් ඒවායේ ප්‍රමණාත්මකභාවය සැලකිල්ලට ගනිමින් අවශ්‍ය පරිදි සුදුසු ගැලපීම් මුල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

## 04. අතැති මුදල් හා බැංකුගත මුදල්

| | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| අතැති මුදල් - සුළු මුදල් | 649,680 | 929,564 |
| බැංකුගත මුදල් - ප්‍රධාන කාර්යාලය හා නිකේතන | (1,513,574) | 1,743,900 |
| බැංකුගත මුදල්- අරමුදල් කළමනාකරණ ගිණුම | 1,570,025,745 | 1,295,495,405 |
| අතැති මුදල්- සුළු මුදල් (කල්පිටිය ව්‍යාපෘතිය) | 15,000 | 15,000 |
| බැංකුගත මුදල්-(කල්පිටිය ව්‍යාපෘතිය) | 16,695 | 16,695 |
| **අතැති මුදල් හා බැංකු ශේෂ වල එකතුව** | **1,569,193,546** | **1,298,200,564** |

බැංකු ගිණුමේ ඇති අරමුදල් දෛනික පදනම මත ලංකා බැංකුවේ අරමුදල් කළමනාකරණ ගිණුමක ආයෝජනය කර ඇත. උපයා ගත් පොලී මුදල සඳහා කරුණාකර අංක 15 සටහන බලන්න.

### 04.01 විස්තර සටහන - අතැති මුදල් හා බැංකුගත මුදල්

| | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| **සුළු මුදල්** | | |
| නුවරඑළිය | 5,849 | 274,546 |
| බණ්ඩාරවෙල | 169,204 | 156,347 |
| අනුරාධපුර | 215,185 | 81,116 |
| කතරගම | 190,540 | 160,273 |
| ප්‍රජා සම්බන්ධතා අංශය | 4,595 | - |
| කල්පිටිය ව්‍යාපෘතිය | 15,000 | 15,000 |
| සුළු මුදල් අග්‍රිමය - නුවරඑළිය | 4,400 | 4,400 |
| සුළු මුදල් අග්‍රිමය - බණ්ඩාරවෙල | 1,814 | 146,170 |
| සුළු මුදල් අග්‍රිමය - අනුරාධපුරය | 55,692 | 101,882 |
| සුළු මුදල් අග්‍රිමය - බෙන්තොට | 2,400 | 2,400 |
| නිකේතන කළමනාකරණය | - | 2,430 |
| **එකතුව** | **664,680** | **944,564** |
| **එක්රැස් කිරීමේ ගිණුම** | | |
| නුවරඑළිය | 1,877,742 | 2,014,525 |
| බණ්ඩාරවෙල | 3,313,086 | 2,146,402 |
| අනුරාධපුරය | 2,495,674 | 2,259,602 |
| කතරගම | 2,661,590 | 3,799,990 |
| බෙන්තොට | 16,241,903 | 2,153,851 |
| බෙන්තොට - සුලන්කා | 233,068 | 233,068 |
| **වෙනත් මෙහෙයුම් ගිණුම්** | **26,823,063** | **12,607,438** |
| අධිකාරියේ ප්‍රධාන ගිණුම | (31,058,936) | (15,054,023) |
| අරමුදල් කළමනාකරණ ගිණුම | 1,570,025,745 | 1,295,495,405 |
| තිරසර සංචාරක | 250,000 | - |
| ප්‍රධාන ගිණුම ඍජු තැන්පතු (Online) | 1,050,341 | 2,397,561 |
| සංචාරක සම්මානය | 1,325,807 | 1,329,557 |
| ආරක්ෂිත තැන්පතු (NSB) | 20,590 | 20,590 |
| ලංකා බැංකුව වාලච්චේනය | 75,561 | 442,776 |
| **එකතුව** | 1,541,689,108 | 1,284,631,867 |
| ව්‍යාපෘති ගිණුම් - ක්‍රියාත්මක වෙමින් පවතින | | |
| කල්පිටිය | 16,695 | 16,695 |
| **මුළු එකතුව** | **1,569,193,546** | **1,298,200,564** |

## 05. වෙළඳ හා වෙනත් ලැබිමට නියමිත දෑ

| | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ 5.01 | 504,767,792 | 376,332,015 |
| පල්දෝරු පද්ධති ලැබිය යුතු දෑ | 143,262,310 | 124,752,772 |
| හුවමාරු,ලැබිය යුතු දෑ | - | - |
| **එකතුව** | **648,030,103** | **501,084,787** |

### 05.01 වෙළඳ හා වෙනත් ලැබිමට නියමිත දෑ

| | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | 81,114,604 | 62,694,204 |
| වෙනත් ලැබිය යුතු දෑ | 409,977,805 | 300,290,643 |
| සේවක ණය හා අත්තිකාරම් | 21,126,205 | 18,242,455 |
| **අනු එකතුව** | **512,218,615** | **381,227,302** |
| අඩුකළා-බොල් ණය හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | (7,450,823) | (4,895,287) |
| **එකතුව** | **504,767,792** | **376,332,015** |

**විස්තර සටහන**

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ පහත වටිනාකම් ඇතුලත් වේ.

| | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| වෙළඳ ණයගැතියන් | 81,114,604 | 62,694,204 |
| විවිධ ගැතියෝ | 6,247,364 | 4,688,558 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය | 90,373,872 | 68,817,469 |
| ශ්‍රී ලංකා සංචාරක හොටෙල් කළමනාකරණ ආයතනය | 8,385,871 | 8,196,422 |
| කල්පිටිය ව්‍යාපෘතිය | 83,682 | 83,682 |
| ජංගම ගිණුම - සංචාරක සංවර්ධන අරමුදල | 256,793,066 | 184,822,683 |
| ජල සේවාව - පාසිකුඩා | 25,555,940 | 23,227,328 |
| ණයගැතියෝ - ශ්‍රී ලංකා කඩදාසි සංස්ථාව | 9,627,113 | 9,627,113 |
| ජංගම ගිණුම - ප්‍රධාන කාර්යාලය | 42,631 | 42,631 |
| අගරු චෙක්පත් | 650,194 | 650,194 |
| වෙළඳ ණයගැති - ජාතික නිවාඩු නිකේතනය | 56,276 | 117,412 |
| ලැබිය යුතු වෙන්දේසි | 76,940 | 15,552 |
